# කොටි ප්‍රශ්නය හා දමනය

ආණ්ඩුව කුමක් කරන්නේ ද යන ප්‍රශ්නය නැඟීමට සිදු වී ඇත. කොටි තම විරුද්ධවාදීන් මරා දැමීම දිනපතා ම මෙන් කරගෙන යයි. හමුදා බුද්ධි අංශය ද ක්‍රම ක්‍රමයෙන් ඝාතනයට ලක්වෙයි. වවුනියාවේ පැවති උත්සවයක දී කොටි ජාතික කොඩිය එසවීමට විරුද්ධ වෙති. අද කොටින්ගේ අණසක වවුනියාවට ද පැතිරී ඇත් ද? පසුගිය දා ත්‍රිකුණාමලයේ එවැනි සිද්ධියක් ඇති වූ අවස්ථාවෙහි ජයන්ත විජේසේකර මන්ත්‍රීතුමාගෙන් කොටින්ට නිසි පාඩම් ලැබුණේ ය. ආණ්ඩුවේ ඇතැමුන්ගේ මතය අනුව ජනතාව ඉදිරිපත් වී කොටි සංවිධානයට විරුද්ධ ව කටයුතු කළ යුතු ය. ඒ බව පසුගිය දා රූපවාහිනී සංස්ථාවෙන් ද කියැවිණි.

කොටින්ට විරුද්ධව ආණ්ඩුව ක්‍රියා නොකරන්නේ ඇයි? අද සිදුවන ඝාතනවලට කොටි පමණක් නොව විපක්ෂය ද ඊනියා සාම නිරීක්ෂකයන් ද ආණ්ඩුව ද වග කිව යුතු ය. අවබෝධතා ගිවිසුම නමින් රනිල් වික්‍රමසිංහ හා ප්‍රභාකරන් අතර අත්සන් කෙරුණු රට පාවා දීමේ ගිවිසුමෙන්  කොටින්ට රිසි සේ මිනී මැරීමට අවස්ථාව ලබා දී ඇත. කොටි ඒ අනුව මිනී මරති. ඊනියා සාම නිරීක්ෂකයෝ මිනී මැරුම් නිරීක්ෂණය කරති. ඔවුන්ට නිරීක්ෂණය කිරීමට වෙනත් දෙයක් ඇත්තේ ද නැත. ආණ්ඩුව ඒ අතර බකන් නිලාගෙන සිටියි. විපක්ෂය අත්පොළසන් දෙයි.

මේ පාවා දීමේ ගිවිසුමට නීත්‍යානුකූල බවක් නැත. එය ජනාධිපතිනිය විසින් අත්සන් කරන ලද ගිවිසුමක් නො වෙයි. රනිල් වික්‍රමසිංහ ද එය අත්සන් කෙළේ ප්‍රභාකරන් සමග එකට සිටිමින් නො වෙයි. රනිල් කඩදාසි කෑල්ලක නෝර්වේ ආණ්ඩුවේ නියෝජිතයන් ලියූ යමක් යටින් අත්සන් කෙළේ ය. ඉන්පසු නෝර්වේ තානාපති (හෝ ඔහුගේ නියෝජිතයෙක්) ඒ කඩදාසි කෑල්ල ගෙන ගොස් එයට ප්‍රභාකරන්ගේ අත්සන ලබාගත්තේ ය. මෙහි ඇති නීත්‍යානුකූල බව කුමක් ද? ආණ්ඩුවට අවශ්‍යතාවක් තිබිණි නම් හා ආණ්ඩුවට කොන්දක් තිබිණි නම් ඊනියා ගිවිසුම ඉරා දමා බොහෝ කල් ය. එහෙත් නිවට ආණ්ඩුවකට කළ හැක්කේ කුමක් ද? ආන්ඩුවේ ඒජන්තයෝ ජනතාවට කොටින්ට විරුද්ධව කටයුතු කරන ලෙස ඉල්ලති.

පසුගිය මැතිවරන සමයේ දී චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද කියා සිටියේ නොර්වේ නියෝජිතයන් අපක්ෂපාති නොවන බව ය. එසේ නම් තවදුරටත් ආණ්ඩුව නොර්වේ නාඩගම නටන්නේ අහවල් දෙයකට ද? කුමාරතුංග මහත්මිය නොබෙල් සාම ත්‍යාගය බලාපොරොත්තුවෙන් සිටින්නී ද? නොබෙල් සාම ත්‍යාගය දේශපාලන ත්‍යාගයක් වෙයි. එසේ වුවත් ඒ ගැන ලියන විට නොකියාම බැරි දෙයක් ඇත. 2004 නොබෙල් සාම ත්‍යාගය දිනූ කෙන්යානු ජාතික පරිසරවේදිනියක වන වංගරී මාතායි මහත්මිය ප්‍රකාශයක් කරමින් කියා ඇත්තේ ඒඩ්ස් පතුරුවන එච් අයි ඒ වයිරසය කෘත්‍රිම ව නිද්පාදනය කරන ලද්දක් බව ය. එය අප්‍රිකානු වඳුරන්ගෙන් මිනිසුන්ට පැමිණි බව බටහිර විද්‍යාඥයන් කීමට මහන්සි ගත්ත ද එය විය නොහැකි යැයි ඒ මහත්මිය පවසයි. අවුරුදු ලක්ෂ ගණනක් තිස්සේ අප්‍රිකාවේ වඳුරන් සමග ජීවත් වූ අප්‍රිකානුවන්ට ඒ කාලය තුළ වයිරසය නොලැබුනේ ඇයි දැයි ඒ මහත්මිය ප්‍රශ්න කරයි. අප ද කලක් තිස්සේ මේ ප්‍රශ්නය පෞද්ගලික සාකච්ඡාවල දී නගා ඇත. කලකට පෙර බ්‍රිතානි පුවත්පත් කලාවේදියකු පොතක් පළ කරමින් කියා සිටියේ එච් අයි වී වයිරසය බටහිර පරයේෂණාගාරයකින් පිටතට ගිය බව ය. බ්‍රිතානි ජනමාධ්‍ය මේ ප්‍රවෘත්තිය ඉක්මනින් ම වසා දැම්මේ ය.

විවෘත හා නිදහස් ජනමාධ්‍යයක් ඇතැයි කීව ද බටහිර ජනමාධ්‍ය අපේ රටේ ජනමාධ්‍යයට ද වඩා පක්ෂපාතී ය. ඒ ඔවුන්ගේ ක්‍රමයට ය. තම ක්‍රමයට හානියක් වන ප්‍රවෘත්තිවලට අවම ප්‍රචාරයක් දෙන්නේ කෙසේ දැයි ඔවුහු දනිති. මාතායි මහත්මිය ද ප්‍රකාශ කර ඇති ආකාරයට ඒඩ්ස් රෝගය වැඩියෙන් ම පැතිරෙන්නේ අප්‍රිකාවේ ය. ඉන්පසු ආසියාවේ ය. මිනිසුන්ගේ නොදැනුවත්කම ලිංගික චර්යාව ආදිය මෙයට හේතුව යැයි බටහිරයෝ අපට කියා දෙති. බටහිරයන්ගේ ලිංගික චර්යාව ගැන කතාකරන්නකු නැත. බොහෝ නළු නිළියන් පමණක් නොව පශ්චාත්නූතනවාදියකු යැයි කියන මිෂෙල් ෆුකෝ ද මිය ගියේ ඒඩ්ස් වැළඳීමෙන් යැයි කියැවෙයි. ඒ කෙසේ වෙතත් අප්‍රිකාවේ හා ආසියාවේ තරමට බටහිර ඒඩ්ස් පැතිර නොයයි. මෙයට හේතුව කුමක් දැයි හරිහැටි කිවහැකි නොවන්නේ නිවැරදි පිළිතුරක් ලබාගත හැකි දිශාවකට අධ්‍යයනයක් නොකෙරෙන බැවින් ය. ප්‍රශ්නයකට නිවැරදි පිළිතුරක් ලබාගත හැක්කේ ප්‍රශ්නය නිවැරදි නම් ය. වැරදි ප්‍රශ්න ඔස්සේ කෙරෙන අධ්‍යයනයන්ගෙන් සිදුවන්නේ ජනතාව මුලාකිරීම පමණකි.

© Prof. Nalin De Silva

උපකල්පනයක් ලෙස එච් අයි වී වයිරසය අප්‍රිකාවේ හා හැකිනම් ආසියාවේ ද ජනයා වඳකිරීම සඳහා බටහිර නිෂ්පාදනය කරන ලද වයිරසයක් ලෙස සලකමින් අධ්‍යයනයක් කරන්නේ ද? මේ සඳහා මුදල් වියදම් කරන්නේ කවුද? අප්‍රිකාවේ මිනිසුන් වඳවුවහොත් ඒ ඉඩම් අයිති කරගන්නේ කවුද යන්න අමුතුවෙන් කිවයුතු නො වෙයි. මෙය උපකල්පනයක් බව අවධාරණය කළ යුතු ය. එහෙත් බටහිරයන් පසුගිය අවුරුදු පන්සියයක් තිස්සේ ක්‍රියාකර ඇති ආකාරය සලකා බලන විට බටහිර පර්යේෂණාගාරයක එච් අයි වී වයිරසය නිර්මාණය කෙරිණි යන්න බැහැර කළ හැකි නො වෙයි.

කෙසේ වෙතත් මාතායි මහත්මියට නොබෙල් සාම තෑග්ග ප්‍රදානය කර ඇත්තේ වැරදීමකින් දැයි සිතෙයි. ඇතැම් විට මේ ප්‍රවෘත්තියට මින්පසු කිසිම ප්‍රචාරයක් නොදීමට බටහිර ජනමාධ්‍ය කටයුතු කරනු ඇත. යම් අයුරකින් කුමාරතුංග මහත්මියට නොබෙල් සාම තෑග්ග හිමිවුවහොත් ඇය බටහිරයන් අමාරුවේ වැටෙන ප්‍රකාශයක් කිසි දිනෙක කරාවි ද? ඇය බටහිරයන්ට කෙතරම් විශ්වාස දැයි කිවහොත් ඇයට එවැනි ත්‍යාගයක් දීමේ අවශ්‍යතාවක් පවා පැන නො නගියි. ඇයට එවැනි ත්‍යාගයක් ලැබුණහොත් එය කරන ලද සේවයක් සඳහා දෙනු ලැබුවක් මිස සේවයක් බලාපොරොත්තුවෙන් දෙන්නක් විය නො හැකි ය.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුව නෝරවේ ඉදිරියේ පාණ්ඩුවකි. නෝරවේ නියෝජිතයන් ආපසු ඔවුන්ගේ රටට නොයවා ඊනියා අවබෝධතා ගිවිසුම ඉරා නොදමා, කොටින්ට මිනී මැරීමට ඉඩ දෙමින් ජනතාවට කොටින්ට විරුද්ධවීමට යැයි කියමින් මේ නටන නෙයියාඩම කුමක් ද? අප නැවත නැවතත් කියන්නේ ප්‍රභාකරන් සමග කිසිම සාකච්ඡාවක් අවශ්‍ය නොවන බව ය. ඒ සාකච්ඡා කුමක් සඳහා ද? සාකච්ඡා කළ යුතු ප්‍රශ්නය කුමක් ද? උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජාතිවාදීන්ට දීමෙන් නැගෙනහිර පළාතේ සිංහලයනට  අත්වන ඉරණම කුමක් ද? උතුරු පළාතේ පදිංචි ව සිටි සිංහලයන් ආපසු එහි යවන්නේ ද?

සන්ධීය රාජ්‍යයක් ඉල්ලන්නේ ඊනියා සුළුතරයේ ප්‍රශ්නයක් විසඳීමට නම් ඉන් කිසිම ප්‍රශ්නයක්  නො විසඳෙයි. උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙන ම පාලනයක් දීමෙන් අනෙක් පළාත්වල ජීවත්වන දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්නය විසඳන්නේ කෙසේ ද? අර සබරගමුවේ හිත උණුවන කවියා සබරගමුවේ දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්න විසඳන්නේ ඒ ජනයා උතුරට හා නැගෙනහිරට යැවීමෙන් ද? අනෙක් අතට ඔවුන් යවන්නේ උතුරට ද නැගෙනහිරට ද? ඒ සම්බන්ධයෙන් ප්‍රභාකරන් හා කරුණා අතර වෙනම සාකච්ඡාවක් සබරගමුවෙහි සංවිධානය කෙරෙන්නේ ද?

මේ සියළු ඊනියා විසඳුම්, විසඳුම් නොව ප්‍රශ්නය ම ය. අවශ්‍ය නම් එවාට විසඳුම් හෙවත් විෂධුම යැයි කිව හැකි ය. විසඳුම හා විසදුම අතර ඇත්තේ සඤ්ඤකයක වෙනසක් පමණක් නො වෙයි. ආණ්ඩුව මතු වී ඇති තත්ත්වයෙන් නියම ප්‍රයෝජන නො ගනියි. ඒ එක් පැත්තකින් බටහිරයන් ඉදිරියේ වැඳ වැටෙන බැවින් ය. අනෙක් පැත්තෙන් බටහිරයන් මෙන් සිතන බැවින් ය. ඔවුන්ගේ සංකල්ප, ප්‍රවාද ආදියට යටවන බැවින් ය. ආණ්ඩුව ප්‍රභාකරන් සමග සාකච්ඡා නොකළ යුත්තේ කරුණු කිහිපයක් නිසා ය. පළමුවෙන් ම සාකච්ඡා කිරීමට ප්‍රශ්නයක් නැත. බටහිර යටත්විජිතවාදීන් විසින් නිර්මානය කරන ලද දෙමළ ජාතිවාදී ප්‍රශ්නයක් නම් මෙරට ඇත. ඒ විසඳීමට ප්‍රභාකරන් සමග සාකච්ඡා කළ යුතු නො වෙයි. දෙවනුව දෙමළ ජනයාගෙන් බහුතරය වාසයකරන්නේ උතුරු නැගෙනහිර පළාත්වලින් පිටත ය. තුන්වනුව ප්‍රභාකරන් (කොටි) යනු දෙමළ ජනයාගේ එකම නියෝජිතයා  නො වෙයි. අද කරුණා නැගෙනහිර පළාතේ නායකත්වය දරයි. ආනන්ද සංගරී මහතා කොටින්ට විරුද්ධ වෙයි. දේවානන්ද මහතා කලක් සිට ම ප්‍රභාකරන් සමග හැපෙයි. හතරවනුව පැහැදිලිවම නැගෙනහිර පළාත උතුරු පළාතෙන් දේශපාලනිකව ඓතිහාසිකව හා භූගෝලීය ව වෙනස් වෙයි. එසේ නම් ප්‍රභාකරන් සමග සාකච්ඡා කරන්නේ මොන කෙංගෙඩියකට ද?

කළ යුත්තේ බටහිරයන් ඉදිරියේ වැඳ නොවැටී දෙමළ ජාතිවාදයට පිළිතුරක් සෙවීම ය. ප්‍රශ්නය හා එහි ඉතිහාසය ගැන නොදැන ප්‍රශ්නයට විසඳුම් සෙවිය නො හැකි ය. ඉතිහාසය යනු ඊනියා ෆැන්ටසියක්වත් යථාර්ථයක්වත් නොවන බව සිංහල බෞද්ධයෝ දනිති. ඒ බව ඇංකරයන් නොදනිත්නම් කළ යුත්තේ කුමක් ද?

© Prof. Nalin De Silva